සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 06 - 2024**

# කතෝලික ධර්මය

**කාලය පැය 02 යි**

නම / විභාග අංකය:

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථය වන්නේ,
    i. අල්කුරාණය ii. භගවත් ගීතය iii. ශු. බයිබලය iv. ත්‍රිපිටකය

02. ශුභාරංචියක් ලියන ලද එක ම අන්‍යජාතිකයා වූයේ,
    i. ශු. ජොහාන් තුමා ය. ii. ශු. ලූක් තුමා ය. iii. ශු. මාක් තුමා ය. iv. ශු. මතෙව් තුමා ය.

03. දෙවියන් වහන්සේ දෙවන දවසෙහි මැවූ මැවිලි වන්නේ,
    i. දවාල සහ රාත්‍රිය ය. ii. ගොඩබිම හා ගස් කොළන් ය.
    iii. පක්ෂීන් හා මසුන් ය. iv. අහස හා ජලය ය.

04. ජේසුස් වහන්සේගේ දෙමව්පියෝ අවුරුදු පතා පාස්කු උළෙලට ජෙරුසලමට ගියේ,
    i. ජුදා සිරිතට අනුව ය. ii. හේබ්‍රෙව් සිරිතට අනුව ය.
    iii. ක්‍රිස්තියානි සිරිතට අනුව ය. iv. සංස්කෘතික සිරිතට අනුව ය.

05. දේව දරුකම, පව් සමාව හා ශුද්ධාත්මයාණන් තුළ නව ජීවිතය හිමිවන ප්‍රසාද නිධානය වන්නේ,
    i. අභිවෘද්ධි ආලේපය ii. සමඟි සන්ධානය
    iii. ප්‍රසාද ස්නාපනය iv. ආශිර්වාදකාර බන්ධනය

06. ප්‍රසාද ස්නාපනයේ දී උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ විසින් නවක කිතුනුවා ආලෝකමත් කරනු ලබන්නේ,
    i. ජලයෙනි ii. සුදු වස්ත්‍රයෙනි
    iii. ශු. තෛලයෙනි iv. පාස්කු ඉටිපහනෙනි

07. තම සේවකයන් ලවා විශාල රන් රූපයක් සාදවා නෙබුකද්නෙශර් රජතුමා එය තැබූ ස්ථානය වන්නේ,
    i. දූරා නම් ස්ථානය ii. ජෙරුසලමේ ය. iii. ජුදයාවේ ය. iv. ගලීලයේ ය.

08. ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය හඳුන්වන්නේ,
    i. ප්‍රාථමික සුවිශේෂය ලෙස ය. ii. පාස්කු අභිරහස ලෙස ය.
    iii. සුබාරංචි ලෙස ය. iv. ගැලවීමේ අභිරහස ලෙස ය.

09. මව්පියන්ට සංග්‍රහ කරව යන පනත දස පනත තුළ සඳහන් වන්නේ,
    i. 4 වන පනතේ ය. ii. 3 වන පනතේ ය. iii. 10 වන පනතේ ය. iv. 5 වන පනතේ ය.

10. ''මිනිසා තනිව විසීම සුදුසු නැත. ඔහුට සුදුසු ........................ මවා දෙන්නෙමි.'' ඉහත හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
    i. මෙහෙකාරියක ii. දැරියක iii. යෙහෙළියක iv. සහකාරියක

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

11. ඊශ්‍රායෙල් ජනතාවට මිසරයේ දී හිරිහැර කළ රජතුමා .................................................. ය.

12. ශු. මාක් තුමා ...................................................... ගෝලයෙකි.

13. ළමා වියේ ජේසුස් වහන්සේ වැඩුණු ආකාරය .................................................. සුභාරංචියේ සඳහන් කරයි.

14. ................................................ පුරුෂයෙකු හා ස්ත්‍රියක අතර ජීවිතාන්තය දක්වා පවතින ගිවිසුමකි.

15. කෙනෙකු බරපතල ලෙස ශාරීරිකව රෝගීව සිටින විට ....................................... ලබාදිය යුතු ය.

(ශු. ලූක් තුමා, ආශිර්වාදකාර බන්ධනය, පාරාවෝ, ශු. පේදුරුතුමාගේ, රෝගීන්ගේ ආලේපය, ප්‍රසාද ස්නාපනය)

**ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16. ශු. බයිබලයේ ප්‍රධාන කොටස් දෙකකි. ( )

17. ශු. ජොහාන්තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරයෙකි. ( )

18. ප්‍රසාද ස්නාපනය ආරම්භක ප්‍රසාද නිධානයකි. ( )

19. ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළේ මහා සිකුරාදා ය. ( )

20. ඉරුදින දිව්‍ය පූජාව අතපසු කිරීම වරදක් නොවේ. ( )

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01. i. ශු. බයිබලයේ පැරණි ගිවිසුමට හා නව ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව වෙන වෙන ම ලියන්න.

ii. පංච පුස්තකයට අයත් පොත් දෙකක් ලියන්න.

iii. මිනිසා අන් මැවිලිවලට වඩා උසස් වීමට හේතු දෙකක් ලියන්න.

iv. ජේසුස් වහන්සේ බැලීමට ශාස්ත්‍රවන්තයින් විසින් රැගෙන ආ පඬුරු දෙකක් ලියන්න.

v. ජුදා ජාතිකයින්ගේ ආගමික හා ජාතික චාරිත්‍ර දෙකක් ලියන්න.

vi. දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතෙහි බාහිර සලකුණු දෙක නම් කරන්න.

vii. ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද දෙකක් ලියන්න.

viii. රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා දෙකක් ලියන්න.

ix. ආරම්භක ප්‍රදාන නිධාන දෙකක් ලියන්න.

x. ප්‍රසාද ස්නාපනයේ දී භාවිත වන සංකේත දෙකක් ලියන්න. (ලකුණු 2 × 10 = 20)

02. i. ශු. ලූක් තුමා දක්ෂතා දැක්වූ ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න.

ii. මාක්, මතෙව් සහ ජොහාන් යන සුබාරංචිවල සංකේත පිළිවෙළින් ලියන්න.

iii. කිතුනුවෙකු ලෙස ඔබ අන් අයට සුබාරංචියක් වන ආකාරය කරුණු පහකින් ලියන්න. (ලකුණු 2+3+5=10)

03. i. දෙවියන් වහන්සේ සතරවන දිනයේ මැවූ මැවිලි දෙකක් ලියන්න.

ii. දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් තුනක් ලියන්න.

iii. දේව මැවිල්ල වැඩි වර්ධනය කිරීමට කළ හැකි දේවල් පහක් ලියන්න. (ලකුණු 2+3+5=10)

04. i. රෝගීන්ගේ ආලේපයෙන් ලැබෙන වරප්‍රසාද දෙකක් ලියන්න.

ii. එක්වරක් පමණක් ලබාගත හැකි දේව ප්‍රසාද නිධාන තුන ලියන්න.

iii. සමඟි සන්ධානය දේව ප්‍රසාදයෙන් ලැබෙන වරප්‍රසාද පහක් ලියන්න. (ලකුණු 2+3+5=10)

05. i. ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම කර ඇති ණය මංගල්‍යයන් දෙකක් ලියන්න.

ii. සබත් දවසේ දී අප විසින් නොකළ යුතු දේවල් තුනක් ලියන්න.

iii. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ලකුණු 2+3+5=10)

06. i. දෙවියන් වහන්සේ දස පනත ලබාදුන්නේ කාටද, කුමන ස්ථානයේ දී ද

ii. දස පනතේ පළමු පනත් තුන නම් කරන්න.

iii. දෙමව්පියන් වෙනුවෙන් දරුවන්ගේ යුතුකම් පහක් ලියන්න. (ලකුණු 2+3+5=10)

07. i. සුවදානයේ දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.

ii. පහත සඳහන් ස්වභාවික ජීවිතයේ අවධිවලට සමාන ප්‍රසාද නිධාන නම් කරන්න.

- උපත :
- පෝෂණය වීම :
- වැඩිවියට පත්වීම :

iii. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලැබීමේ පියවර පහ නම් කරන්න. (ලකුණු 2+3+5=10)